# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය : PE/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.03.08
திகதி :

**<u>TR-02 (15)</u>**

.................................................................
.................................................................
.................................................................

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට වාහන වෙන් කර දීම.</u>**

2010.01.26 දින පැවති ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාලව රාජ්‍ය ආයතන සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සතු වාහනපිළිබඳ කරන ලද සංගණනයේදී ඔබ ආයතනයෙන් මාවෙත එවා ඇති වාහන ලේඛනයෙහි ඇතුළත් තොරතුරු පදනම් කර ගනිමින් 2010.04.08 දින පවත්වනු ලබන පාර්ලිමේන්තු මැතිවරණයේදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවීම සඳහා ඔබ ආයතනයෙන් තෝරා ගත් වාහනලේඛනය මේ සමග අමුණා ඇත. මෙම වාහන වෙන් කරනු ලබන්නේ කුමන දිස්ත්‍රික්කයන් වෙතද යන්න පසුව දන්වනු ලැබේ.

02. **තවද ඔබ ආයනයට අයත් මෙම වාහන වාර්තා කළ යුතු දිනය, ස්ථානය හා වේලාව පිළිබඳව එක් එක් දිස්ත්‍රික්කයන්හි තේරීම්භාර නිලධාරීන් විසින් ඉදිරියේදී දැනුම් දෙනු ඇත.** එසේ දැනුම් දුන් වහාම නියමිත වේලාවට එම දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තා කිරීමට හැකිවනු පිණිස සියළු වාහන මුදා හැරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. ඒ සඳහා මෙම වාහන හොඳ ධාවන තත්වයෙන් තබා ගැනීම පිණිස කළ යුතු අළුත්වැඩියාවන් හෝ සේවා කිරීම් ඇත්තේ නම් ඒවා සිදුකරන ලෙස ඔබට කාරුණිකව දන්වමි. පසුගිය ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී මවිසින් වෙන් කර දෙන ලද දිස්ත්‍රික්කය හැර වෙනත් දිස්ත්‍රික්ක සඳහා ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වාහන යවන ලද අවස්ථාවන් මා වෙත වාර්තා වී ඇත. එබැවින් මවිසින් වෙන් කරදෙනු ලැබූ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත හැර වෙනත් කිසිදු දිස්ත්‍රික්කයකට එසේ වාහන යැවීමට කටයුතු නොකළ යුතු බවට අවධාරණය කරමි.

03. **ඡන්ද විමසීමේ කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතු වාහන ලබාදීම අත්‍යවශ්‍ය හා අනිවාර්ය කාර්යයක් බව ඔබ වෙත අවධාරණය කරනු කැමැත්තෙමි. තවද දීප ව්‍යාප්ත ඡන්ද විමසීමකදී අතිවිශාල වාහන ප්‍රමාණයක් අවශ්‍ය වන හෙයින් ඒවා කුලී පදනම මත ලබා ගත හොත් අතිවිශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදුවනු ඇත.**

04. **මෙම චක්‍රලේඛයෙන් දැනුම් දී ඇති පරිදි සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් කටයුතු කළ යුතු අතර, මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.**

**දයානන්ද දිසානායක,**
මැතිවරණ කොමසාරිස්.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.03.11

**චක්‍රලේඛ අංක -TR/02 -16**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා ,**

**නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>2010 පාර්ලිමේන්තු මැතිවරණය .</u>**

**<u>ඡන්ද පොල ප්‍රවාහන පහසුකම් සහ අවතැන් ඡන්ද දායකයින්ගේ ප්‍රවාහන පහසුකම් සැළසීම</u>**

**<u>සඳහා ශ්‍රී ලංකා ගමන ගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම.</u>**

2010.04.08 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සහ අවතැන් ඡන්ද දායකයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැළසීම සඳහා ද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීම අනුමත කරමි. ඔබගේ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රාදේශිය ඩිපෝ අධිකාරීන් සමග සාකච්ඡා කර අවශ්‍ය බස්රථ සංඛ්‍යාව වෙන් කරවා ගන්න.

02. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන් සමග ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද සාකච්ඡාවකදී එළඹි එකඟත්වයකට අනුව පසුගිය ඡන්ද විමසීම් වලදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ ලබාදීමේදී අයකරන ලද ගාස්තු ප්‍රමාණයන් සංශෝධනය කිරීමට එකඟ වන ලදී.

03. උතුරේ අවතැන් ඡන්ද දායකයන් ඡන්දය පාවිච්චි කිරීම සඳහා පොකුරු ඡන්ද මධ්‍යස්ථාන වලට යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීමේදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ ලබා දීමට මෙදින පැවැති සාකච්ඡාවේදී එකඟත්වයකට එළඹිණි. ඒ අනුව වව්නියාව හා යාපනය තේරීම් භාර නිලධාරීන් විසින් ඒ සඳහා අවශ්‍ය බස් රථ සංඛ්‍යාව නොපමාව අදාල ඩිපෝ අධිකාරීන් වෙත දැනුම් දීමට කටයුතු කරන්න.

04. පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ ලබාදීමට එම ආයතනය එකඟ වී ඇත.

| | පැය12 ට අඩු කාලයක් සඳහා මුදා හරින බස්රථ සඳහා | පැය 12 වැඩි කාලයක් සඳහා මුදා හරින බස් රථ සඳහා |
|---|---|---|
| ආසන 42 හෝ ඊට වැඩි බස් රථ සඳහා | 8000/- | 9000/- |
| ආසන 32 හෝ ඊට වැඩි බස් රථ සඳහා | 6000/- | 7000/- |
| උපරිම කිලෝමීටර් ගණන | 100 | 125 |
| උපරිම කි.මි. ගණන ඉක්මවා වූ විට කි.මි. 1 ක් සඳහා | රු 60 /- | රු.60 /- |
| පැය 24 කාලයක් ඉක්මවූ විට ගාස්තුව පැයකට | රු. 400/- | |

05. ඡන්ද විමසීම නිමා වීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ඔබ විසින් ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත් :** 1. ප්‍රධාන මෙහෙයුම් අධිකාරී
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, නාරාහේන්පිට - ඔබේ අංක ශ්‍රී ලංගම / ප්‍රවේඅ/ මැතිරා/128/2010 හා 2010.03.10 දිනැති ලිපිය පරිදි අදාල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ අවශ්‍යතාවය පරිදි අවශ්‍ය බස්රථ ලබා දිම සඳහා ඔබගේ ඩිපෝ අධිකාරීන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

2. අතිරේක මැතිවරණ කොමසාරිස් (1) - දැනගැනීම සඳහා
3.විගණකාධිපති - දැනගැනීම සඳහා
4. ගණකාධිකාරී (මුදල්) - අවශ්‍ය කටයුතු සඳහා
5 . ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : P.E/24/2010
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.03.19

<u>TR-02(18)</u>

.............................................................
.............................................................
.............................................................

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>කොළඹ සංචිතයෙන් වාහන වෙන්කරදීම</u>**

මේ සමඟ ඇති ඇමුණුමෙහි සඳහන් ඔබ ආයතනයට අයත් වාහන / වාහනය .............................. දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස මවිසින් එම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත වෙන්කර දී ඇත.

02. මෙම සියළු වාහන වාර්තා කළ යුතු දිනය, වේලාව හා ස්ථානය පිළිබඳව එම දිස්ත්‍රික්කයේ අදාළ නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් විසින් ඔබට දැනුම් දෙනු ඇත. එසේ දැනුම් දුන් වහාම නියමිත වේලාවට වාර්තා කිරීමට හැකිවන පරිදි සියළුම වාහන නිදහස් කර යැවීමට කටයුතු කළ යුතුය.

03. එසේ යවනු ලබන වාහන සඳහා එම **දිස්ත්‍රික්කයට යාමට ප්‍රමාණවත් ඉන්ධන ප්‍රමාණය පමණක් ලබාදීමට කටයුතු කළ යුතු අතර** ඒ සඳහා වැයවූ මුදල් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත. ඒ සඳහා PV 2 ආකෘතිය යොදා ගත යුතුය. දිස්ත්‍රික්කය තුල ධාවනය සඳහා අවශ්‍ය ඉන්ධන හා ආපසු සිය කාර්යාලයට පැමිණීමට අවශ්‍ය ඉන්ධන ද දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී විසින් ලබාදෙනු ඇත.

පහත සඳහන් ආකෘති පත්‍ර අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ අමුණා ඇත.

- ඉන්ධන ප්‍රතිපූරණය කිරීමේ ආකෘති පත්‍රය - PV-2
- සංචිත වාහන රියදුරු මහතුන්ගේ රාජකාරී කටයුතු සම්බන්ධ උපදෙස් පත්‍රිකාව
- සංචිත වාහන ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු වල යෙදවීම V-3 පත්‍රිකාව

04. එක් එක් වාහනය සඳහා ඉහත සඳහන් V-3 උපදෙස් පත්‍රිකාව පිටපත් 02 කින් සම්පූර්ණ කර වාහනය වාර්තා කළයුතු දිස්ත්‍රික්කයේ සහකාර තේර්ීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදීම සඳහා රියදුරුට භාරදීමට කටයුතු කරන්න. ඡන්ද විමසීම නිමවී ආපසු පැමිණෙන අවස්ථාවේදී එම පත්‍රිකාවේ "ආ" කොටස පුරවාගෙන එක් පිටපතක් රියදුරු විසින් රැගෙන ආ යුතු අතර එය ඔහුගේ ගමන් වියදම් ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතුය. ඡන්ද විමසීම නිමවීමෙන් පසු ඉන්ධන වියදම් ප්‍රතිපුරණය කිරීම සඳහා PV-2 ආකෘතිය සම්පූර්ණ කර එම V-3 ආකෘතියේ ජායා පිටපතක් ද සමග නොපමාව මැතිවරණ මහලේකම් කාර්යාලයට එවීමට කටයුතු කරන්න.

05. මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් ඉන්ධන වියදම් ප්‍රතිපුරණය කිරීම කරනු ලබන්නේ කොළඹ සංචිතයෙන් මවිසින් වෙන්කර දෙන ලද වාහන සඳහා පමණක් බව කාරුණිකව දන්වමි. අනිකුත් වාහන සඳහා අදාළ දිස්ත්‍රික්කයන්හි නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

06. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී - දැනගැනීම සඳහා
02. නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් - දැනගැනීම සඳහා
03. ගණකාධිකාරී (මුදල්) - දැනගැනීම සඳහා
04. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා